# දෙළුම් මලේ කථාව



ඉනුකි ලිතුම්සා බණ්ඩාර



# දෙළුම්

## උද්භිත විද්‍යාත්මක නාමය

## පුනිකා ග්‍රැනටම්

## (*Punika Granatum*)

## කුලය පුනිකේසියේ

## (*Punicaceae*)

## විදේශීය ශාකයකි

## කුඩා ගසක්

## ඖෂධීය ගුණ සහිත ශාකයකි.

ප්‍රථම එළිදැක්වීම - 08.02.2025
ISBN No. 978-624-208-779-5



# පිදුම !

මේ පොත සැකසීමට මා දිරිමත් කළ
මගේ
පන්තිභාර ගුරුතුමියටත්
පරිසර කමිටු භාර ගුරුතුමියටත්
ඡායාරූප ගැනීමට
මට උදවු කළ සෙවණැල්ලක් මෙන් මා අසලම රැඳෙන
මාගේ දෙමව්පියන්ටත්
ආදරයෙන් මේ පොත
පිරි නමමි...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# දෙළුම් ගහේ ගෙඩි හැදෙන හැටි

මගේ ගෙදර වත්තේ දෙළුම් ගහක් තියනවා. දෙළුම් කියන්නේ ඖෂධීය ශාකයක්. දෙළුම් ගසේ පොඩි පොහොට්ටු දෙකක් තිබුණා. එක එක පොහොට්ටුවක් අනිකට වැඩිය ටිකක් ලොකුයි. දෙළුම් පොහොට්ටුවේ පාට උඩ හරිය රතු පාටයි යට හරිය තැඹිලි පාටයි. මැද හරිය කහ පාටයි. හැඩය නිකම් රට කජු පොත්තේ හැඩය වගේ. මේ දෙළුම් මල් දෙළුම් ගෙඩිය වෙනකම් මොකද වෙන්නේ කියලා බලන්න මට හිතුණා.





අද අළුත් දවසක් පොහොට්ටු දෙක පොඩ්ඩක් ලොකු වෙලා කියලා දැණුනා. හැබැයි පාට හැඩය වෙනස් වෙලා නැහැ.





අද පාසල් ඇරිලා ආපු ගමන් දෙළුම් පොහොට්ටු බබලන්න ගියා. ලොකු පොහොට්ටුව පොඩ්ඩක් ඇරිලා. පොඩි පොහාට්ටුව තාම ඇරිලා නෑ. ලොකු පොහාට්ටුවේ ඇරුණ තැන උල් හයක් තිබුණා.





අද ඉර පායලා තිබුණු ලස්සන දවසක්. පොහොට්ටුව තව ටිකක් ඇරිලා තිබුණා. මලේ පෙති එළියට පෙණුනා. ඒත් පෙති ඇරිලා තිබුණේ නෑ.



තවත් දවසක් උදා වුණා. දෙළුම් මලේ පෙති එළියට ඇවිල්ලා හැබැයි සම්පූර්නම ඇරිලා තිබුණේ නෑ.

අදත් මම උදේම ගියේ දෙළුම් මල් බලන්න. මලේ පෙති වෙන් වෙලා තිබුණා. පෙති හයක් තිබුණා, පාට තද තැඹිලි පාටයි. පෙති හරිම සිනිදුයි. පෙති ඇද වෙලා තිබුණා. අනික් පොහොට්ටුව ඇරිලා තිබුණා.

කුඹියෙක් මලේ ඇවිදිනවා දැක්කා.




පිපිලා තිබුණු දෙළුම් මල බලන්න මම උදේම ගියා. මලේ පෙති හය හොඳටම ඈත් වෙලා තිබුණා. මණිපත්‍ර ඈත් වෙලා. මැද රේණු පේනවා. රේණු තද කහ පාටයි. මැද දිගට කීලයක් තිබුණා. කීලය අග මහත් වෙලා. ඒකට කියන්නේ කලංකය කියලා. අනික් මලේ පෙති එළියට ඇවිල්ලා.




මලේ රේණු මත චුටි මැස්සෙක් වහලා හිටියා. එයා ඉගිලිලා ගිහින් මල් වලත් වහනවා මම දැක්කා.

ඉර පායලා තිබුණ ලස්සන දවසක්. මල ලස්සනට පිපිලා තිබුණා. මලේ රේණු මත කහ පාට සමනළයෙක් වහලා හිටියා. පිහාටු වල කළු පාට තිත් තිබුණා. පිහාටු වටේට බීක්කු බීක්කු වගේ තිබුණා. හරිම ලස්සනයි.

මල් රේණු වල පරාග සමනළයාගේ පාදවල තැවරෙනවා. ඒ සමනළයා තවත් මල් වල වහනවා මම දැක්කා. ඒකට තමයි පරාගනය සිදුවෙනවා කියන්නේ. රෑ වෙලා මම මල දිහා බැලුවා මලේ පෙති ටික පොඩ්ඩක් ඇකිලිලා





හවස ඇකිලුණ මල බලන්න මම උදෙන්ම ගියා. ඉර එළිය මලට වැටිලා තිබුණා. රෑ ඇකිලිලා තිබුණ මල් පෙති දිග ඇරිලා. ඉර එළියට මල ආය පිපෙනවා මට හිතුනා.

අනික් මලේ පෙති හොඳට ඇරිලා තිබුණා.



අද වැස්ස දවසක් මලේ ලස්සනට වැහි බිංදු රැඳිලා තිබුණා. මලේ පෙති තුනක් හැලිලා තිබුණා. පෙති දෙකක් වතුරට ඇලිලා තිබ්බා. අනික් මලේ පෙති තාම හොඳටම ඇරිලා නෑ.

වැටිලා තිබුණ පෙති මම අහුලා ගත්තා වටේ පොඩි රැලි වැටීලා.





අදත් පාසල ඇරිලා ආපු ගමන් මම ගියේ මල බලන්න. මලේ තව පෙති දෙකක් හැලිලා තිබුණා. එක පෙත්තක් ඉතුරුයි, මැද තිබ්බ රේණු ලා කහ පාට වෙලා අනික් මල තවත් පිපිලා. පෙති හරි සිනිදුයි.



දෙළුම් මල් වලට අද මොකද වුණේ. මලේ ඉතුරු පෙත්තත් වැටිලා මණි පත්‍ර කහපාට වෙලා මලේ ඩිම්බ කෝෂය තියන කොටසත් පාට අඩු වෙලා රේණු ඇකිලිලා. පාට දුඹුරු පාටයි. කීලය නැමිලා කලංකය ඇකිලිලා අනිත් මලේ පෙති දිග ඇරිලා.



පෙති හැළුණු දෙළුම් මල බලන්න අදත් මම දෙළුම් ගස ලගට ගියා. මලේ රේණු තවත් ඇකිලිලා දුඹුරු පාට වෙලා කීලය තවත් නැමිලා අනිත් මලේ පෙති ඔක්කෝම හැලිලා. ඒත් රේණු තාම කහ පාටයි. රේණු මත මී මැස්සෙක් හිටියා. දෙළුම් මලේ පැණි තියනවාද දන්නේ නැ?




මට හමු වූ පරාගනයට උදවු වන සතුන්
1. කුඹියා
2. චූටි මැස්සා
3. සමනලයා
4. මී මැස්සා



අදත් ඉර එළිය තිබුණු ලස්සන දවසක්. රේණු ගොඩක් හැකිලිලා. දුඹුරු පාට වෙලා කීලය දුඹුරු පාට වෙන්න පටන් අරගෙන මණිමත්‍ර පොඩ්ඩක් කහ වෙලා.

අනික් මලේ රේණු කහ පාටයි කීලය සුදු පාටයි මම රේණු අල්ලලා බැලුවා කහ පාටට අතේ ගෑවුනා. මේවා තමයි පරාග කියන්නේ මේවා සතුන්ගේ ඇගේ ගෑවිලා තව මලකට ගියාම ඒ මලේ ගෑවෙනවා.



දැන්නම් දෙළුම් මල් දෙළුම් ගෙඩි වෙන්න පටන් අරන්. ඩිම්බ කෝෂය තිබුණ තැන ලොකු වෙලා. තැඹිලි පාට අඩු වෙලා කොළ පාට වැඩි වෙලා.



අද වැස්ස දවසක් රේණු වල වතුර තිබුණා. මම රේණු අල්ලලා බැලුවා වතුර අතේ ගැවුණා. කහ පාට පරාග ගෑවුනේ නෑ. වැස්ස දවසට පරාගනය වෙනවා අඩුයි. කීලය දැන් කළු පාටයි.





අදත් මම දෙළුම් ගෙඩිය බලන්න ගියා. ඩිම්බ කෝෂය තිබෙන තැන ලොකු වෙලා, ලා කොළ පාට වැඩි වෙලා මණිපත්‍ර යට තද තැඹිලි

අද මම දැක්කා දෙළුම් ගහේ අළුත් දළු ඇවිල්ලා, ඒවා රතු හා රෝස පාටයි.



දෙළුම් පොහොට්ටු හැදිලා දැනට මාසයක් විතර වෙලා. ගෙඩිය තවත් ලොකු වෙලා මණිපත්‍ර වලට වැඩිය ගෙඩිය ලොකුයි මණිපත්‍ර කහවුණාට මණිපත්‍ර තද තැඹිලි ඉතුරු වෙලා දැන් මගේ චුටි මල් දෙක දෙළුම් ගෙඩි දෙකක් වෙලා.



අද අපේ ගෙදරට රිලා පුංචලා ඇවිල්ලා. එක ගෙඩියක මණිපත්‍රයක් කැඩිලා තිබුණා. රිලා පුංචලා අද මගේ දෙළුම් ගෙඩිය ඇල්ලුවද දන්නේ නෑ ?



දැන් දෙළුම් ගෙඩිය මණිපත්‍ර වලට වැඩිය ලොකුයි. මණිපත්‍ර යට තැඹිලි පාට අඩුවෙලා.

මණිපත්‍රය කැඩුන තැන දුඹුරු පාට වෙලා හරියට අපේ තුවාලයක් උනහම හොඳ වෙනවා වගේ රේණු ගොඩක් හැකිලිලා මණිපත්‍ර වල කහ පාට අඩු වෙලා.





අද වැස්ස දවසක් දෙළුම් ගෙඩිය උඩ වතුර බිංදු රැඳිලා තිබුණා. එක් ගෙඩියක තව මණිපත්‍රයක් කැඩිලා තිබුණා. අදත් රිලා පැංචලා එන්න ඇති.



අද මම ගෙදර එනකොට දෙළුම් අත්තේ එක ගෙඩියයි තිබුණේ. මම හැම තැනම අනිත් ගෙඩිය හෙව්වා. ඒක දෙළුම් ගහ යට වත් ළඟ පාත වත් තිබුණේ නෑ. අපේ ගෙදර එහා පැත්තේ බැල්කනියේ දෙළුම් ගෙඩියේ කෑලි තිබ්බා. දෙළුම් ඇට තාම පැහිලාවත් නෑ තාම සුදු පාටයි.

රිලා පුංචලා දෙළුම් ගෙඩිය කලා තිබුණේ වෙන තැනක . දෙළුම් ගෙඩිය පැහිලා තිබුණ නම් තව පැළයක් හැදෙන්න තිබ්බා එකට තමයි අපි කියන්නේ බීජ ව්‍යාප්තියට සතුන් උදවු වන බව ඒත් අම්මයි මායි දෙළුම් ගෙඩිය රිලා පුංචලාගෙන් ආරක්ෂා කරගන්න උපක්‍රමයක් යෙදුවා. අපි පොලිතීන් මල්ලකින් ආවරණය කළා.



මෙන් මෙහෙමයි දෙළුම් පොහොට්ටුව දෙළුම් ගෙඩියක් වෙන්නේ. මේ දෙළුම් ගෙඩිය ලොකු වෙලා කනකන් මට ඉවසිල්ලක් නෑ.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්